
# විපක්ෂ නායකයාගේ වගකීම

**ප්‍ර**ජාතන්ත්‍රවාදීව පාර්ලිමේන්තු ක්‍රමයක් යටතේ පාලනය වන රටක පාලක ආණ්ඩු පක්ෂයට මෙන්ම විපක්ෂයටද විශේෂ සැලකිල්ලක් හිමිවේ. මහා බ්‍රිතාන්‍යය ප්‍රධාන පොදුරාජ්‍ය මණ්ඩලීය රටවල මෙම ලක්ෂණය බොහෝ විට දැකිය හැකි ය. මෙවන් රටක විපක්ෂ නායකයා හඳුන්වන්නේ විකල්ප අගමැතිවරයා (Alternative Prime Minister) ලෙස ය.



Ranil Wickramasinghe



Ed Miliband



Mrs Bandaranayake

මහා බ්‍රිතාන්‍යය, ඉන්දියාව, ඕස්ට්‍රේලියාව, කැනඩාව, සිංගප්පූරුව වැනි රටවල විධායක බලතල හා රාජ්‍ය බලය රඳා පවතින්නේ අගමැතිවරයා මත බැවින් විපක්ෂ නායකවරයාගේ කාර්යභාරය ඒ තරමට වැදගත් වේ. එහෙත් ශ්‍රී ලංකාව හා පකිස්ථානය වැනි රටවල විධායක බලතල රැඳී ඇත්තේ ජනාධිපතිවරයා මත නිසාත්, ජනාධිපති පාර්ලිමේන්තුවේ නියෝජනය නොවන නිසාත් විපක්ෂ නායකයාගේ කාර්යභාරයෙහි වැදගත්කම තරමක් හීනවී ඇත. රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳව විපක්ෂ නායකයා එල්ලකරන විවේචන වලට පිළිතුරු ලබා ගැනීමට ජනාධිපතිවරයා නොමැති වීම මීට හේතුවයි.

කෙසේ වෙතත් රජයේ ප්‍රතිපත්ති හා ක්‍රියාකාරකම් පිළිබඳ විවේචනාත්මක හඬක් නැංවීමටත්, ඒ සඳහා අනිකුත් දේශපාලන පක්ෂ ඒකරාශි කරගැනීමටත් විපක්ෂ නායකයා සමත්විය යුතුය. පොදු සතුරා ඉදිරියේ සාමූහික විය යුතුය යන දේශපාලන න්‍යායට අනුව රජයට විරුද්ධ මතවාදීන් ඒක රාශි කරගැන්මට ඔහු ක්‍රියා කළ යුතුය.

1948 නිදහස ලැබීමෙන් පසුව ශ්‍රීලංකාවේ විපක්ෂ නායකවරුන් ලෙස ආචාර්ය ඇන්.ඇම්. පෙරේරා, එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක. ඩඩ්ලි සේනානායක, සී. පී. ද සිල්වා, ජේ. ආර්. ජයවර්ධන, සිරිමාවෝ බණ්ඩාරනායක, අනුර බණ්ඩාරනායක, ඒ. අමිර්තලිංගම්, ගාමිණී දිසානායක, රනිල් වික්‍රමසිංහ, මහින්ද රාජපක්ෂ යන අය වරින්වර ක්‍රියාකර ඇත.


පාර්ලිමේන්තු මැතිවරණයකින් පසුව වැඩිම ආසන හිමි දේශපාලන පක්ෂයට බලය හිමිවී එය ආණ්ඩු පක්ෂය වන අතර, ඊළඟට වැඩිම ආසන ගණනක් හිමි පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ නායකයා විපක්ෂ නායකයා ලෙස පත් කෙරේ. විපක්ෂ නායක නම් කරන්නේ කතානායකවරයාය. විපක්ෂ මන්ත්‍රීවරුන්ගේ වැඩිම විශ්වාසය දිනාගත් මන්ත්‍රීවරයා විපක්ෂ නායකයා ලෙස පත්කිරීම කතානායකවරයාගේ අභිමතය පරිදි වේ.

මහා බ්‍රිතාන්‍ය මැතිවරණය නොබෝදා නිමවීමත් සමග විරුද්ධ පක්ෂ නායකයා ලෙස ගෝර්ඩන් බ්‍රවුන් පදවිය භාර නොගත්තේය. පසුව ලේබර් පක්ෂයේ වැඩබලන නායිකාව ලෙස සිටි හැරියට් හාමන් විපක්ෂ නායක පදවියට පත්වුව ද, එඩ් මිලිබෑන්ඩ් පසුව ලේබර් පක්ෂයේ නායකයා බවට පත්වූ නිසා යළිත් විපක්ෂ නායකයා ලෙස එඩ් මිලිබෑන්ඩ් නම් කරන්නට කතානායකවරයාට සිදුවිය.

ශ්‍රීලංකාවේ ද 1980 සහ 1994 දී විපක්ෂනායක පත්කිරීමේ දී අර්බුද මතු වූයේ ය. 1980 දී ප්‍රජා අයිතිය අහිමිව සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියට පාර්ලිමේන්තුවෙන් ඉවත්වීමට සිදුවීම නිසා විපක්ෂනායක ධුරය හිස්විය. ඒ වන විට ශ්‍රීලංකා නිදහස් පක්ෂ පාර්ලිමේන්තු කණ්ඩායමේ නායකයා ලෙස ක්‍රියා කළේ මෛත්‍රීපාල සේනානායක මහතායි. එහෙත් මන්ත්‍රීවරුන් වැඩි දෙනෙකුගේ ලිඛිත ඉල්ලීම මත අනුර බණ්ඩාරනායක මහතා විපක්ෂ නායක වරයා ලෙස පත්කිරීමට කතානායකවරයාට සිදුවිය.

1994 අගෝස්තු මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂයට විපක්ෂයේ අසුන් ගැනීමට සිදුවිය. එහිදී හිටපු අගමැති ලෙස විපක්ෂනායකයා විය යුත්තේ රනිල් වික්‍රමසිංහ මහතා ය. එහෙත් එවකට ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙකු ලෙස සිටි ගාමිණී දිසානායක මහතා විපක්ෂ නායකකම ලබාගැන්මට උත්සුක විය. මේ නිසා එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රීවරුන් අතර රහස් ඡන්දයක් පවත්වා පාර්ලිමේන්තු කණ්ඩාය මේ නායකයා තෝරාගැන්මට තීරණය වූයේ ය. එම රහස් ඡන්දයෙන් වැඩි ඡන්ද 4 කින් ජයගත් දිසානායක මහතා විපක්ෂ නායකයා ලෙස පත් කෙරුණි.

ශ්‍රීලංකාවේ විපක්ෂ නායකයාට ධුරාවලිය (Protocol) අනුව ද විශේෂ තැනක් හිමිවේ. කැබිනට් අමාත්‍යවරයෙකුට සමාන වැටුප් ද, වරප්‍රසා ද, නිල වාහන හා කාර්ය මණ්ඩලයක් ද ඇත. මීට අමතරව ඔහුට නිල නිවාසයක්ද වෙනම ලැබේ. පාර්ලිමේන්තුව තුළදී විපක්ෂ නායකයා කරන ප්‍රකාශ ඉතා වැදගත්ය. ඒවා ප්‍රබල මහජන හඬක් නැංවීමට හේතුපාදක වේ. විපක්ෂයට පක්ෂ කිහිපයක්ම එකතු වී ඇති අවස්ථාවක ඒ ඒ අනෙකුත් පක්ෂවල ප්‍රතිපත්ති වලටද විපක්ෂනායක සවන් දිය යුතු ය.



J. R. Jayawardena



Amirthalingam



Anura Bandaranayake

රජයේ ප්‍රතිපත්ති විවේචනය කරන විටක විපක්ෂනායකයෙකුට තමා බලයට පැමිණියහොත් කටයුතු කරන ආකාරය පැහැදිලි කිරීමෙන් රටේ අනාගත නායකයා වීමට තමාට ඇති සුදුසුකම පෙන්නුම් කළ හැකි ය.

අද ශ්‍රීලංකාවේ විපක්ෂනායකයා මෙම ලකුණු කොපමණ දුරට පෙන්වන්නේද යන්න ගැටළුවකි. රටක වඩාත් ආකර්ෂණීය දේශපාලකයා විපක්ෂ නායකයා ය. ජනප්‍රිය වන්නේද ඔහු ය. බුරුමයේ විපක්ෂ නායිකාව වන අවුන්සාන්කී මෙයට හොඳ නිදසුනකි.

විපක්ෂ කණ්ඩායම තුළ තම ජනප්‍රියතාව හීනවී ඇත්නම් හෝ, රජයට ප්‍රබල අභියෝගයක් එල්ල කිරීමට අසමත් වේනම් විපක්ෂනායක පදවිය වෙනත් කෙනෙකුට පැවරීම ඥාණාන්විත ය. එමගින් තමාගේ ජනප්‍රියතාව සහ කෘතහස්ත භාවය රැකගත හැකිවේ.

1952 වසරේ දී ආචාර්ය ඇන්. ඇම්. පෙරේරා මහතා විසින් එස් ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතාටද, 1970 දී ඩඩ්ලි සේනානායක මහතා විසින් ජේ. ආර්. ජයවර්ධන මහතාටද විපක්ෂ නායක පදවිය බාරදුන්නේ මේ නිසාය. විපක්ෂයේ මන්ත්‍රීවරු ආණ්ඩු පක්ෂයට පැන යන්නේ නම් එහි වගකීම ද විපක්ෂ නායකයා දැරිය යුතු වෙයි. විපක්ෂනායකයා තම ක්‍රියාකාරකම් වලින් විකල්ප නායකයා තමා බව ජනතාවට තහවුරු කළ යුතු වෙයි.

*ශ්‍රීලංකා පාර්ලිමේන්තුවේ හිටපු නියෝජ්‍ය වේත්‍රධාරී*

♦ **මේජර් වී. බී. කරුණාරත්න**

**Oxford UK**

**Major V. B. Karunaratne**
**Ex Deputy Sergeant-At-Arms in SL Parliament**



**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ (University Grant Commission) ගොඩනැගිල්ලේ දේපළවලට අලාභ හානි සිදුකිරීම් චෝදනාව මත රිමාන්ඩ් භාරයේ පසුවන විශ්වවිද්‍යාල සිසුන් 21 දෙනා හිරගෙදර සිට බන්ධනාගාර නිලධාරීන් විසින් උසාවියට ගෙන එන ලද අවස්ථාවයි මේ. ඔවුන්ට රුපියක් 25,000 බැගින් ඇප නියම කරනු ලැබ ඇත.**



# සිංහල තරුණ පෙළ හෙට කොයිබටද ?



**අ**පේ පැරණි නළුවෙකු හා ගායකයෙකු වන එඩී ජූනියර්ගෙ ගායනයක් මට දැන් මතක් වුණා. ඒකෙ වචන මෙහෙමයි.....

කොයිබටදෝ මෙ සතා.....යන්නෙ මෙසේ.... මග බැසලා....
සසර මගේ.... හැටි නොදැනා.... කොයිබටදෝ මෙ සතා.....

ලංකාවෙ සිංහළ තරුණ පෙළ ගැන මට කියන්න තියෙන්නෙත් එච්චරයි. මේ හාදයො හරි අවාසනාවන්ත පිරිසක්....

ලංකාවේ ඉංග්‍රීසි හෝ සිංහළ පත්තරයක් ගත්තොත් හැම දාම වගේ දකින්න ලැබෙන ප්‍රවෘත්තියක් තමයි ශිෂ්‍ය නොසන්සුන්තාව (student unrest). මෙතන ශිෂ්‍ය කියන්නේ විශ්වවිද්‍යාල ශිෂ්‍යයින්ටයි. මට හිතෙනවා ඉදිරියේදි ලංකාවෙ බාලාංශ පන්ති වල ළමයි පවා හික්මවා ගන්න බැරි පිරිසක් වේවි කියලා.

මේ යුරෝපයේ තිබෙන විශ්වවිද්‍යාල ගණන මම ගණන් කළේ නැහැ. ඒත් මුළු මහත් එක්සත් රාජධානියේම ඇති විශ්ව විද්‍යාල ගණන මම දන්නවා. එංගලන්තයේ 89 යි. ස්කොට්ලන්තයේ 14 යි. වේල්සයේ 10 යි. උතුරු අයර්ලන්තයේ 2 යි. එතකොට එකතුව 115 යි. මෙයට අමතරව මේ මහා බ්‍රිතාන්‍යයේ විශ්වවිද්‍යාල මට්ටමේම උසස් අධ්‍යාපනය ආයතන 165 ක් තිබෙනවා. මේ කිසිම විශ්වවිද්‍යාලෙක මා මෙහි ජීවත්වන පහුගිය වසර 35 තුළ එකද ශිෂ්‍ය නොසන්සුන්තාවක්, නීති කඩකිරීමක්, විශ්වවිද්‍යාල ශිෂ්‍යයින්ට බැටන් ප්‍රහාරයක්, කඳුළු ගෑස් ගැහීමක්, ඔවුන් අත් අඩංගුවට ගැනීමක් මා දැකලා නැහැ. මෙහේ විශ්ව විද්‍යාලවල ශිෂ්‍ය ශිෂ්‍යාවෝ අනම් මනම් නැහැ, තමන්ගෙ මූලික කාර්ය්‍ය වන ඉගෙනීම කරනවා. අපේ ලංකාවෙ විශ්ව විද්‍යා ශිෂ්‍යයන්ගෙ මූලික දේ අනම් මනම්, අධ්‍යාපනය ඔවුන් අන්තිමටම හිතෙන දේ. ඒකයි වෙනස.

ශ්‍රීලංකාවේ අවුරුද්දකට අපොස සාමාන්‍ය පෙළ විභාගය සමත්වෙලා විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබන්නට ළමයින් **60,000** ක් සුදුස්සො වෙනවා. ඒත් විශ්වවිද්‍යාලවල ඉඩ තියෙන්නෙ **20,000** කට විතරයි. ඉතිරි තුනෙන් දෙක වෙනත් ක්ෂෙත්‍ර තුළින් තම ඉදිරි අධ්‍යාපනික කටයුතු පිරිමහ ගන්නවා. සල්ලි තියන අයගෙ ළමයි පෞද්ගලික ආයතන වලට බැඳෙනවා එහෙම නැත්නම් පිටරටක විශ්වවිද්‍යාලෙකට යනවා. සාමාන්‍ය සහ දිළිඳු පවුල්වල ළමයින්ට ජීවිතේට ලැබෙන ලොකුම වරප්‍රසාදයක් තමයි විශ්වවිද්‍යාලෙකට ඇතුළත් වෙන්න ලැබීම. ඔවුන්ගෙ අනාගතය දීප්තිමත් කරගන්න තිබෙන එකම අවස්ථාව ඒක. හුඟක් දෙමව්පියෝ ඉඩකඩම් විකුණලා උගස්තියලා ණයට මුදල් අරගෙන ඒ උසස් අධ්‍යාපනේට වියදම් කරන්නෙත් ඒ නිසාමයි.

විශ්වවිද්‍යාලෙට ගිය ගමන් වාමාංශික ව්‍යාපාරය ගම්වලින් ආපු මේ ළමයි සේරම ගිලගන්නවා. මේ ළමයි ඒ රතු සහෝදරයින්ගෙ අතකොළු බවට පත්වෙනවා. ඉගෙනීම පැත්තකට දාලා උද්ඝෝෂණ වලට යනවා. පෝස්ටර් අදිනවා. පාරෙ ඉඳන් පත්‍රිකා බෙදනවා. පොලීසියට හූ කියනවා. ගල්වලින් ගහනවා. දේපළ වලට අලාභ හානි කරනවා. අත්බෝම්බ ඔතනවා. හිරේ යනවා. ඉගෙන ගන්න සුදුසු හඳු යෞවන වයස ඔන්න ඔය විදියටයි ගත වෙන්නෙ. ජීවිතේ අන්තිම කාලෙ වෙනකොට ඉගෙන ගත්තු දෙයක් නෑ. බුද්ධියක් නෑ. හම්බකරගත්තු දෙයක් නෑ. පසුතැවීම විතරයි ඉතුරුවෙන්නෙ. ඒපාර සමාජෙට, රජයට, අච්චට, වැස්සට, ඔය හැම දේකටම බැන බැන ඉඳලා මැරිලා යනවා.

**1970** ඉඳලා මේ දක්වාම ලංකාවෙ සිංහළ තරුණ සමාජය දිහා බැලුවම ඒක මහා ඛේදවාචකයක්. මෙතෙන්දි පැහැදිලිවම කිව යුතු එක කාරණයක් තියනවා. ඔය තරුණයො මෙහෙයවන වාමාංශිකයන්ගෙ දරුවො එකෙක්වත් ඔය තත්වෙට වැටිලා නෑ. ගම්වලින් ආපු සිංහළ ළමයි කරපුවා මේ ළමයින්ට කියලා කරවලා නෑ. උන් පෝස්ටර් ඇඳලා නෑ. පාරවල්වල රස්තියාදු වෙලා නෑ. පිටරට යවලා උන්ගෙ අධ්‍යාපනය හොඳ තත්වයකින් යුතුව අවසන් කරවලා ජීවිතේ ඉහළ මට්ටමටම ගෙනැල්ලා. දැන් වුනත් හොයලා බැලුවොත් පෙනේවි මං කියන දේ ඇත්ත නැත්ත!

දෙමළ ළමයි, මුස්ලිම් ළමයි කරබාගෙන ඉගෙන ගන්නවා. මුලාවෙ වැටෙන්නෙ සිංහළ ළමයි විතරයි. මේ සියල්ලේ විපාක විඳින්න සිද්ධවෙන්නේ දැන් නෙවෙයි, තව අවුරුදු ගණනකට පස්සෙ. එතෙන්දි සිංහලයින්ට වෙනදේ හිතාගන්න මට නම් බෑ. මගේ ප්‍රාර්ථනාව, දැන් වත් සිංහළ ළමයින්ගෙ මොළේ පෑදේවා!

♦ *වෙලේගෙදර රාළ* **London**